ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# <u>පුස්තකාල සහ ප්‍රලේඛන නිලධාරී තනතුරට බඳවාගැනීම - 2024</u>

## <u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව</u>

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කායර්ාලයේ පවතින පුස්තකාල සහ ප්‍රලේඛන නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩුව වෙනුවෙන් අභ්‍යන්තර කායර් මණ්ඩලයෙන් සහ දැනට රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-</u>**

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්වය ලබයි.

**1.1. සුදුසුකම් :-**

**1.1.1 බාහිර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම උපාධියක් හෝ අදාළ විෂය ක්ෂේත්‍රය සම්බන්ධ උපාධියක් ලබා තිබීම

**1.1.2. අභ්‍යන්තර (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

1.2 **වයස**: අයදුම්පත් භාරගන්නා දින වයස අවු : 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.

1.3 **වෙනත්**
සියලුම අපේක්ෂකයින්,

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii. තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා ශාරීරිකව හා මානසිකව නිරෝගී විය යුතුය.
iii. යහපත් චරිතයක් තිබිය යුතුය.

<u>වැටුප් පරිමාණය :-</u>

MA 3-2016 - (රු. 32,200 – 10 x445-11x660 – 10x730 – 5x 750 – 54,960)

මීට අමතරව මූලික වැටුපෙන් 25% දීමනාවක් හා ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**<u>බඳවාගැනීමේ ක්‍රමය :-</u>**

- පහත දැක්වෙන කරුණු යටතේ පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සුදුසු අයවලුන් තෝරාගනු ලැබේ.

| | | |
|---|---|---|
| අදාළ අතිරේක අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| වෙනත් සුදුසුකම් | - | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | - | ලකුණු 25 |

ඉහත පරිදි සුදුසුකම් ලැබුවන් පුස්තකාල සහ ප්‍රලේඛන නිලධාරී තනතුර සඳහා බඳවාගනු ලැබේ. බඳවාගනු ලබන්නන් වසර 3ක පරිවාස කාලයකට යටත් වන අතර, පරිවාස කාලය සාර්ථකව අවසන් කරන අයවලුන් තනතුරේ පිහිටවූදා සිට බලපාන පරිදි ස්ථිර කිරීමට කටයුතු කරනු ලැබේ.

තනතුරේ උසස්වීම් හා අනෙකුත් ප්‍රතිලාභ එම තනතුරේ බඳවාගැනීමේ පරිපාටියට අනුව සිදු කරනු ලැබේ.

පහත දැක්වෙන ආකෘතිය අනුව A4 ප්‍රමාණයට සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024/07/20** දිනට පෙර ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අංක 14, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 04 ලිපිනයට ලැබෙන සේ තැපැල් මඟින් යොමුකළ යුතු වේ.

ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.